*සැ. යු.-* 2011.04.01 දින පළවූ අංක 1,700 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවී ය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,701 - 2011 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා - 2011.04.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 832 |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අප්‍රේල් මස 15 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අප්‍රේල් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, පළාත් පාලන ආයතනයන්හි ආදායම් පරීක්ෂක II වැනි පංතියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2011

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනයන්හි ආදායම් පරීක්ෂක II වන පංතියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 2.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(iv) අනුව මෙම තනතුරුවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 13,120-145 x 10-170 x 11-240 x 10-320 x 10 - රු. 22,040කි. (රා. ප. චි. ලේ. 06/2006.iv විධිවිධාන අනුව MN 1-2006A හි 12 වැනි පියවර ආරම්භක පියවර වේ.)

2.2 *වයස් සීමාව.*—අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 23ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. බඳවා ගනු ලබන අවස්ථාවේ දී උපරිම වයස නොඉක්මවා තිබිය යුතුය. දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

2.3 *සේවා කොන්දේසි.*—අනුමත සේවා ව්‍යවස්ථාව අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය.—2011.04.28 වේ.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට සාමාර්ථයක් ලබා තිබීම.

05. අපේක්ෂකයින්—

5.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය,
5.2 මනා චරිතයකින් යුක්ත විය යුතුය,
5.3 මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා කායික හා මානසික වශයෙන් සුදුසු විය යුතුය,
5.4 අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2011.04.28 දිනට බස්නාහිර පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03ක කාලයක් ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතුය. මේ සඳහා ස්ථිර පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් සහතිකයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට භාජනය කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු අනුව ආදායම් පරීක්ෂක II වැනි පන්තියට බඳවා ගනු ලැබේ. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇත්නම් සුදුස්සෙකු තෝරා ගැනීමේ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

07. *ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :*

මෙම පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විතය.

1. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි, ලකුණු 100 යි.
2. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි. ලකුණු 100 යි.

1. *සාමාන්‍ය දැනීම* - ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වමින් වර්තමාන ලෝකයේ ආර්ථික සමාජයීය, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික හා තාක්ෂණික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ බහුවරණ මාදිලියේ ප්‍රශ්නවලින් සාමාන්‍ය දැනීම කොටස සමන්විතය.

2. *බුද්ධි පරීක්ෂණය* - අපේක්ෂකයින්ගේ තර්කන ශක්තිය, තීරණ ගැනීමේ සහ විනිශ්චය කිරීමේ හැකියාව, ගණිතමය, භාෂාමය හා සංකල්පිත හැකියාව ඇතුළුව බුද්ධිය මැනීමට අදාළ වන්නා වූ ඔවුන්ගේ මානව හැකියාවන් මැනෙන බහුවරණ මාදිලියේ ප්‍රශ්නවලින් බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබාගත යුතු අතර අනුමත පුරප්පාඩු සංඛ්‍යාව අනුව ප්‍රශ්න පත්‍ර දෙක සඳහා වැඩිම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙල මත, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගනු ලැබේ.

බඳවා ගැනීමේ විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන් පවත්වනු ලබන අතර, අයදුම්පතේ ඉල්ලුම් කර ඇති භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08. දැනට වාර්තා වී ඇති පුරප්පාඩු හා ඉදිරියේ දී ඇතිවන පුරප්පාඩු, යථොක්ත විභාගයෙන් සමත් අයවළුන් සිටිනම් එම අයගෙන් පිරවීම පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

09. විභාග ගාස්තු වශයෙන් රු. 350 ක් පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-90-01 ට බැරවන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ.ප. 1 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව ද සැලකිය යුතුය.

10. ඉල්ලුම් කළ යුතු පිළිවෙල :

මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ.මී. 21 x 29) කඩදාසියේ දෙපැත්ත ප්‍රායෝජනයට ගනිමින් අයදුම්පත සකස්කර ගත යුතුය. අයදුම්පත සැකසීමේ දී ආදර්ශ අයදුම්පතේ පරිදි අංක 01 සිට 06 තෙක් පළමු පිටුවට ද, අංක 07 සිට 09 තෙක් දෙවැනි පිටුවට ද ඉතිරිය තෙවැනි පිටුවට ද වන ලෙස සකස් කළ යුතුය. තව ද අයදුම්පත පිළියෙල කරගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2011.04.28 දිනට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරශ්‍රය, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන

ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක II වැනි පංතියට බඳවා ගැනීම - 2011" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) ප්‍රමාදවී ලැබෙන හා ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් අයැදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයැදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

11. නිවේදනයේ ඇති සුදුසුකම් සපුරා නොමැති අයගේ අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයැදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

12. අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයැදුම්කරුවෙකුම තනතුරට අදාල සියලු සුදුසුකම් 2011.04.28 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

13. බඳවා ගැනීමේ විභාගය, විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන්නේ නම්, අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බස්නාහිර පළාත) වෙත හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද සමග "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බස්නාහිර පළාත) නිදහස් චතුරශ්‍රය, කොළඹ 07" වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

14. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව

තමා පෙනී සිටින විෂයය සඳහා විභාග ශාලාධිපති වෙත අයැදුම්කරු තම අනන්‍යතාව ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පමණක් පිළිගනු ලැබේ. :-

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

සටහන.—විභාග ශාලාවේ දී තම අනන්‍යතාව තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

15. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

16. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්/පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

17. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කොරනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

18. අයැදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

වී. රාජපක්ෂ,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

බස්නාහිර පළාත,
2011 මාර්තු මස 29 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, පළාත් පාලන ආයතනයන්හි ආදායම් පරීක්ෂක II වැනි පංතියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2011

Filling of Revenue Inspector Grade 'II' B vacancies of Local Government Institutions of Western Provincial Public Service

විභාග අංකය [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - (කොටුව තුල අංකය යොදන්න)

කොළඹ - 1
ගම්පහ - 2
කළුතර - 3
[ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය - (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
[ ]

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

02. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

03. ස්ථිර ලිපිනය :———.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාල අංකය කොටුව තුල ලියන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

05. (i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2011.04.28 දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

අවුරුදු | | මාස | | දින | |

(ii) දුරකථන අංකය රාජකාරි :———.

පෞද්ගලික :———.

06. උපන් දිනය : වර්ෂය :——. මාසය :——. දිනය :——.

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන …… දිනට වයස :

අවුරුදු | | මාස | | දින | |

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද /ලියාපදිංචිවීමෙන් ද ? :———.

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :
අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 යටතේ,

(අ) (i) අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය සහ නව විෂය නිර්දේශය ද පැරණි නිර්දේශය යටතේ ද යන වග :———.
(ii) විභාග අංකය :———.
(iii) ඉංග්‍රීසි විෂයයට ලබා ඇති සාමාර්ථය :———.

(ආ) (i) ලබාඇති උපාධිය :———.
(ii) උපාධිය ලබාගත් විශ්වවිද්‍යාලයේ නම :———.
(iii) උපාධිය වලංගු දිනය :———.

(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :———.

දිනය :———.
ලදුපත් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
ලදුපත් අංකය :———.

ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

09. …………… වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනයන්හි ආදායම් පරීක්ෂක II වැනි පංතියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳකාරවම දනිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*
*(අනවශ්‍ය වචන කපා හරින්න)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................ මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව හඳුනන් බවත්, ඔහු/ඇය ................. දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම :———.
අත්සන :———.
තනතුර හා නිල මුද්‍රාව :———.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 2,37,060ට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුයි.)

*රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*
*(අනවශ්‍ය වචන කපා හරින්න)*

........................ මයා./මිය./මෙනවිය දැනට..................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................ වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත් ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයකු සේ සලකා ඇති/නැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :———.

04-446

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.